**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2013**
**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

# ආර්ථික විද්‍යාව II

පැය තුනයි

සියලුම හිමිකම් ඇවිරිණි

***සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාවේ මෙහෙයවීමෙන්***

සැලකිය යුතුයි :

**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

1. (i) පහත සඳහන් දෑ කවර නිෂ්පාදන සාධකයකට අයත් වේ ද?

(අ) මිනිරන් නිධියක්.
(ආ) වී වගාවට යොදා ගන්නා ගවයින්.
(ඇ) කාර්මික ශිල්පියෙකු විසින් වාහනයක් අළුත් වැඩියා කිරීම.
(ඈ) රජය විසින් පශු සම්පත් ප්‍රවර්ධන සැලසුමක් ක්‍රියාත්මක කිරීම. (ලකුණු 04)

(ii) එක්තරා ආර්ථිකයක සම්පත් සම්භාරය පූර්ණ හා කාර්යක්ෂම ලෙස භාවිත කොට සිරස් අක්ෂයේ කාර්මික භාණ්ඩ ද තිරස් අක්ෂයේ කෘෂිකාර්මික භාණ්ඩ ද දැක්වෙන නිෂ්පාදන හැකියා මායිමකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| කාර්මික භාණ්ඩ | කැප කරන කෘෂි කාර්මික භාණ්ඩ ප්‍රමාණය |
|---|---|
| 0 | - |
| 10 | 5 |
| 20 | 10 |
| 30 | 15 |
| 40 | 20 |
| 50 | 50 |

(අ) ඉහත තොරතුරු ආධාරයෙන් නිෂ්පාදන හැකියා මායිම අඳින්න. (ලකුණු 02)
(ආ) ඉහත ආර්ථිකයේ සම්පත්වල ස්වභාවය හා නිෂ්පාදන ශිල්ප ක්‍රම පිළිබඳව ඔබට කුමක් කිවහැකි ද? (ලකුණු 02)
(ඉ) කාර්මික භාණ්ඩ 30ක සහ කෘෂිකාර්මික භාණ්ඩ 85ක නිමැවුම් සංයෝගයක් සමාජය අපේක්ෂා කරයි නම් ආර්ථිකය මුහුණ පා සිටින ගැටලුව කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ඊ) “රටක ආර්ථික වෘද්ධියත් සමඟම නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වේ, එමගින් තවදුරටත් හිඟකම පිළිබඳ ප්‍රශ්නය ඇතිවන්නේ නැත.” එකඟවේ ද ? පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iii) වෙළෙඳපොළ ආර්ථිකයක, ආර්ථික කාරකයන් වෙත මිල මඟින් කවර කාර්යභාරයක් ඉටු කරනු ලැබේ ද ? (ලකුණු 03)
(iv) විකල්ප ආර්ථික පද්ධති විසින් නිෂ්පාදනය පිළිබඳ ගැටලුව විසඳනු ලබන ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 03)
(v) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීමේ ක්‍රමයක් ලෙස වෙළෙඳපොළ ආර්ථිකය, ප්‍රශස්ත නොවන්නේ කවර තත්වයන් යටතේ ද? (ලකුණු 02)

**2**. (i) සැපයුම් නීතිය පැහැදිලි කර සැපයුම් වක්‍රය ඉහළට බෑවුම් වන්නේ කවර හේතු නිසාදැයි දක්වන්න. (ලකුණු 04)

(ii) එක්තරා භාණ්ඩයක් සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් තොරතුරු පහත දැක්වේ.

| ඒකකයක මිල | ඉල්ලුම් ප්‍රමාණය | අධි සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 10 | 1000 | -1000 |
| 40 | 400 | 200 |

(අ) ඉහත භාණ්ඩයේ වෙළෙඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය කවරේද?(ලකුණු 02)

(ආ) ඉහත භාණ්ඩ ඒකකයක් සඳහා රජය විසින් රුපියල් 10 ක නිශ්චිත සහනාධාරයක් සපයන්නේ නම් පහත සඳහන් දෑ දක්වන්න.

(i) නව සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය (ලකුණු 02)

(ii) සහනාධාරයට පෙර හා පසු පාරිභෝගික අතිරික්තයන් (ලකුණු 02)

(iii) සහනාධාරයට පෙර හා පසු නිෂ්පාදක අතිරික්තයන් (ලකුණු 02)

(iv) සහනාධාරය සඳහා රජය දැරූ වියදම (ලකුණු 01)

(v) සහනාධාරය නිසා අභිමිවන ශුභසාධනය (ලකුණු 01)

(iii) මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක දක්වන්න. (ලකුණු 03)

(iv) "සාධක විකිණීමෙන් ලැබෙන ඉපැයීම් තුළ අන්තර්ගත ආර්ථික බදු කුලී ප්‍රමාණය, සාධක සැපයුම් නම්‍යතාව මත තීරණය වේ". මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 03)

**3**. (i) හීනවන ඵල සහ අඩුවන පරිමාණානුකූල ඵල යන සංකල්ප අතර වෙනස දක්වන්න (ලකුණු 04)

(ii) (අ) ගණකාධිකරණ ලාභය, ආර්ථික ලාභයෙන් වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) ප්‍රාමාණික ලාභය, නිෂ්පාදන ක්‍රියාවලියේ පිරිවැයක් ලෙස සැලකිය හැකිද ? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) නිෂ්පාදන ක්‍රියාවලියක ඇතැම් ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා දරන වියදම් "ගිලුණු පිරිවැයක් " ලෙස සලකන්නේ ද ? පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) (අ) ඒකාධිකාරී වෙළෙඳපොළක් සහ කතිපයාධිකාරී වෙළෙඳපොළක් අතර වෙනස්කම් දක්වන්න. (ලකුණු 04)

(ආ) පූර්ණ තරගකාරී ආයතනයක කෙටි කාලීන සැපයුම් වක්‍රය සහ නිෂ්පාදනය අත්හිටුවීමේ ලක්ෂ්‍යය රූප සටහනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

**4**. පහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයක් පිළිබඳ කල්පිත දත්ත පෙළකි.

| | රුපියල් මිලියන |
|---|---|
| විදේශ වලින් ලැබුණු දේපොළ ආදායම් | 50 |
| ශුද්ධ පොළී | 200 |
| ශ්‍රමික ඉපැයීම් | 1000 |
| කුටුම්භ සඳහා රජයේ සංක්‍රාම වියදම | 300 |
| බෙදන ලද ලාභාංශ | 60 |
| ශුද්ධ වක්‍ර බදු | 200 |
| බදු කුලී ආදායම | 300 |
| දළ දේශීය නිෂ්පාදිතය | 1900 |
| රඳවාගත් ලාභ | 40 |
| අපනයන | 400 |

| | |
|---|---|
| ආනයන ………………………………………………… | 200 |
| විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම ………………………….. | 70 |
| සමාගම් ලාභ මත බදු ………………………………. | 50 |
| දළ ආයෝජන ………………………………………. | 300 |
| පෞද්ගලික බදු ……………………………………….. | 100 |
| ඉපැයූ නමුත් කුටුම්භ වෙත නොලැබුණු ආදායම ……. | 250 |
| විදේශ වලට ගෙවන ලද දේපළ ආදායම …………….. | 100 |

(i) පහත සඳහන් දෑ ගණනය කරන්න.
- (අ) ජාතික ආදායම
- (ආ) වෙළෙඳ පොළ මිල යටතේ ශුද්ධ දේශීය නිෂ්පාදිතය
- (ඇ) වෙළෙඳ පොළ මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය
- (ඈ) වැය කළ හැකි කුටුම්බ ආදායම
- (ඉ) ජාතික ඉතුරුම් (ලකුණු 02 බැගින් ලකුණු 10)

(ii) හේතු දක්වමින් පහත සඳහන් සිදුවීම් පැහැදිලි කරන්න.
- (අ) රටක දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ ජාතික නිෂ්පාදිතය අඩු අගයක් විය.
- (ආ) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයට වඩා දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඉහළ අගයක් විය.
- (ඇ) කිසියම් වර්ෂයක මූර්ත ජාතික නිෂ්පාදිතයට වඩා මූර්ත ජාතික ආදායම ඉහළ අගයක් විය.
- (ඈ) වර්තන මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතයට වඩා ස්ථාවර මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය පහළ අගයක් විය.
- (ඉ) දළ දේශීය වියදමට වඩා දළ දේශීය නිෂ්පාදිතය පහළ අගයක් විය. (ලකුණු 05)

(iii) (අ) කිසියම් ආර්ථිකයක නිරීක්ෂණය නොකෙරෙන ආර්ථික ක්‍රියා කවරේ ද ? (ලකුණු 03)
(ආ) එවැනි ආර්ථික කටයුතු නිසා ජාතික ගිණුම් තක්සේරුකරණයට ඇතිවන බලපෑම කවරේ ද ? (ලකුණු 02)

**5**. කිසියම් ආර්ථිකයක් සම්බන්ධ පහත තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| | | |
|---|---|---|
| ආන්තික පරිභෝජන නැඹියාව | (MPC) | = 0.75 |
| ආයෝජනය | (I) | = 225 |
| ස්වාධීන පරිභෝජනය | (a) | = 150 |

(i) (අ) සමතුලිත නිමැවුම ගණනය කරන්න. (ලකුණු 02)
(ආ) සමස්ත වියදම, සමස්ත කාන්දුවීම් හා සමස්ත විදීම් රේඛා ප්‍රස්තාරයක දක්වන්න. (ලකුණු 02)

(ii) මෙම ආර්ථිකයට, රජය මැදිහත් වී රු.මිලියන 40ක භාණ්ඩ හා සේවා මිලදී ගනී එසේම කුටුම්බ සංක්‍රාම ලෙස රු. මිලියන 40ක් ලබා දෙන අතර රු. මිලියන 60ක ස්වාධීන බද්දක් අයකරනු ලබයි.

(අ). නව සමතුලිතය පෙන්වන්න. (ලකුණු 02)
(ආ) එම අවස්ථාවේ ආර්ථිකයේ කාන්දුවීම්, විදීම් වලට සමාන බව පෙන්වන්න. (ලකුණු 02)

(iii) මෙම ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති සමතුලිත මට්ටම කරා ළඟා වීමට නිමැවුම රු. මිලියන 600 කින් වැඩිකළ යුතුය. මේ සඳහා ආර්ථිකයේ ආයෝජනය කොතරම් වැඩිකළ යුතු ද ? (ලකුණු 04)

(iv) (අ). පූර්ණ සේවා නියුක්ති සමතුලිත නිමැවුම් මට්ටම යටතේ සමාහාර ඉල්ලුම තවදුරටත් වැඩිවන්නේ නම් ආර්ථිකයේ කුමන තත්වයක් ඇතිවිය හැකි ද? රූප සටහනක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ආ). විවෘත ආර්ථිකයක සමාහාර ඉල්ලුමට අදාළ සංරචක දක්වන්න. (ලකුණු 02)

(v) කුටුම්බ පරිභෝජනය තීරණය වීම කෙරෙහි බලපාන සාධක කවරේ ද ? (ලකුණු 03)

**6.** (i) පදනම් මුදල් යනු කුමක්දැයි පැහැදිලි කර එය මුදල් සැපයුම හා සම්බන්ධවන්නේ කෙසේ ද යන්න දක්වන්න. (ලකුණු 04)

(ii) වාණිජ බැංකු පද්ධතියක ඒකාබද්ධ ශේෂ පත්‍රය පහත දැක්වේ.

| වත්කම් | | වගකීම් | |
|---|---|---|---|
| තැන්පතු | 500 | මුදල් සංචිතය | 70 |
| | | භාණ්ඩාගාර බිල්පත් | 130 |
| | | ණය හා අත්තිකාරම් | 300 |
| | **500** | | 500 |

මහ බැංකුව නියම කරන ලද සංචිත අනුපාතය 20% කි. මෙම බැංකු පද්ධතිය ස්ථාවරව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ගැලපීම් කිරීමෙන් පසු නව ඒකාබද්ධ ශේෂ පත්‍රය ගොඩනගන්න. බහුවිධ තැන්පතු සංකෝචනය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) අන්තර් බැංකු ඒකපණ ණය වෙළෙඳපොළ පොලී අනුපාතික ස්ථායිතාව ඇති කිරීමට මහ බැංකුව කවර ආකාරයකට මැදිහත් වේ ද? (ලකුණු 04)

(iv) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු කවරේද? (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් දක්වන්න. (ලකුණු 03)

(v) සමාහාර ඉල්ලුම ප්‍රසාරණය කිරීමෙහි ලා මූල්‍ය ප්‍රතිපත්තිය යොදාගනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 03)

**7.** (i) (අ). වෙළෙඳපොළ අසමත්වීම (Market Failure ) හා ආණ්ඩුව අසමත්වීම (Government Failure) යන සංකල්ප ඊට බලපාන හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ). පහත සඳහන් භාණ්ඩ, කවර භාණ්ඩ ගණයකට අයත්වේ දැයි හේතු දක්වමින් පැහැදිලි කරන්න.

(a). හෝරා ස්ථම්භ.

(b). ඕසෝන් ස්ථරය.

(c). අධ්‍යාපනය.

(d). පිහිනුම් තටාකයක්.

(e). සාගරයේ සිටින මත්ස්‍යයින්. (ලකුණු 05)

මහනැණ අත්වැල

(ii) " සාර්ව ආර්ථික අරමුණු කරා ආර්ථිකය මෙහෙයවීමෙහිලා, ප්‍රතිචක්‍රීය (අභිමතානුසාරී) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති යොදා ගැනීම, විවිධ වූ විවේචනයන්ට භාජනය වී ඇත". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) (අ) බදු ක්‍රමයේ "සාධාරණත්වය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද ? (ලකුණු 02)

(ආ) අනුක්‍රමික බදු, ප්‍රතික්‍රමික බදු හා සමානුපාතික බදු උදාහරණ සපයමින් විස්තර කරන්න. (ලකුණු 03)

(ඉ) අධි බදු බර (Excess Burden) යන්නෙන් කුමක් අදහස්වේ ද? එහි ක්‍රියාකාරිත්වය ඉල්ලුම් නම්‍යතාව මත තීරණය වන ආකාරය රූප සටහන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iv) 2011 වසරේ ශ්‍රී ලංකාවේ අයවැය හිඟය මූල්‍යනය කළ ආකාරය දක්වා එහි ප්‍රතිවිපාක විමසන්න. (ලකුණු 02)

**8.** (i) එක් එක් රට තුළ ශ්‍රම ඒකකයකින් නිෂ්පාදනය කළ හැකි නිමැවුම් ප්‍රමාණ පහත දැක්වේ.

| රට | ගුවන් විදුලි යන්ත්‍ර | පරිගණක යන්ත්‍ර |
|---|---|---|
| චීනය | 4 | 10 |
| තායිවානය | 1 | 5 |

එක් එක් රට තුළ ශ්‍රම ඒකක 100 බැගින් තිබුනේ යැයි උපකල්පනය කරන්න.

(අ) ගුවන් විදුලි යන්ත්‍ර හා පරිගණක යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි පවතින්නේ කුමන රටට ද ? (ලකුණු 02)

(ආ) එක් එක් රටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර දක්වා සාපේක්ෂ වාසිය පදනම් කරගෙන පූර්ණ විශේෂීකරණයක් සිදුකළ හොත් එක් එක් රටේ නිෂ්පාදන සංයෝග නිෂ්පාදන හැකියා මායිම්වල දක්වන්න. (ලකුණු 02)

(ඉ) සාපේක්ෂ වාසි මත පදනම් වූ විශේෂීකරණයෙන් පසු ගුවන්විදුලි යන්ත්‍ර 100 කට පරිගණක යන්ත්‍ර 400 ක් හුවමාරු කළ හොත් එක් එක් රටේ පරිභෝජන හැකියා මායිම්, නිෂ්පාදන හැකියා මායිම් අඳන ලද ප්‍රස්තාර සටහන් මත ම නිරූපනය කරන්න. (ලකුණු 02)

(ඊ) රටවල් දෙකටම අන්‍යෝන්‍ය වාසි ලැබෙන බාහිර හුවමාරු අනුපාතික පරාසය දක්වන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ගනුදෙනු ගෙවුම් ශේෂ ලේඛනයේ කවර ගිණුම්වල ඇතුළත් කරනු ලැබේ ද?

(අ) විදේශ රටවලට ගෙවන ලද ණය පොලිය.
(ආ) රජය ලබාගත් දිගුකාලීන විදේශ ණය වාරික ආපසු ගෙවීම.
(ඉ) විදේශ රටවල රැකියා කරන ශ්‍රී ලාංකිකයන් මෙරටට එවන ප්‍රේෂණ
(ඊ) ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින් විදේශ රටවලට යාමට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම.

(ලකුණු 04)

(iii) නාමික ආරක්ෂණ අනුපාතය සහ සඵල ආරක්ෂණ අනුපාතය අතර වෙනස දක්වන්න. (ලකුණු 02)

(iv) ස්ථාවර විදේශ විනිමය අනුපාතික ක්‍රමයේ සහ නම්‍ය විදේශ විනිමය අනුපාතික ක්‍රමයේ වාසි සහ අවාසි දෙක බැගින් දක්වන්න. (ලකුණු 04)

(v) ශ්‍රී ලංකාව සම්බන්ධව සිටින කලාපීය ආර්ථික සහයෝගීතාවයන් හතරක් දක්වන්න. (ලකුණු 02)

**9**. (i) ආර්ථික වෘද්ධිය නිර්වචනය කොට, ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග නම් කරන්න . (ලකුණු 04)

(ii) "සර්ව සහභාගිත්ව ආර්ථික වෘද්ධිය" හා "දිළින්දන්ට හිතකර ආර්ථික වෘද්ධිය" යන සංකල්ප අර්ථ දක්වන්න. (ලකුණු 04)

(iii) "මානව සංවර්ධනය" සහ "තිරසාර සංවර්ධනය" හඳුන්වමින් ඒවායේ මානයන් දක්වන්න. (ලකුණු 04)

(iv) (අ) ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතිකයන් හි ප්‍රවනතා දක්වන්න. (ලකුණු 02)

(ආ) ජනගහනය වියපත්වීමේ සමාජ ආර්ථික බලපෑම් කවරේද?, එය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග ලෙස ඔබ හඳුනා ගන්නේ මොනවාද? (ලකුණු 04)

(v) "බහුමාන දරිද්‍රතා දර්ශකය" ගණනය කරනුයේ කෙසේද? (ලකුණු 02)

**10** (i) (අ) **2006** වසරේ ඉදිරිපත් කරන ලද දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුවේ ඉලක්ක කළ ආර්ථික වෘද්ධි හා ආයෝජන අභිලාශයන් කවරේ ද? (ලකුණු 02)

(ආ) ගතවූ වසර පහ තුළ දස අවුරුදු දැක්ම සංවර්ධන රාමුවේ ඉලක්ක වෙත ළඟාවීමට ශ්‍රී ලංකා ආර්ථිකයට හැකිවී තිබේ ද පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ඉ) ආර්ථික වෘද්ධි හා ආයෝජන ඉලක්ක සපුරා ගැනීමේලා ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දෙන අභියෝග කවරේ ද? (ලකුණු 03)

(ii) "ප්‍රාග්ධන හිඟය හෙවත් ආයෝජන පරතරය, ආර්ථික වෘද්ධි ඉලක්ක සපුරා ගැනීමෙහිලා ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රබල අභියෝගයකි."

(අ) ප්‍රාග්ධන හිඟය යනු කුමක් ද, එය පියවා ගත හැකි මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාව වෙත ගලා එන විදේශ සෘජු ආයෝජන ප්‍රවාහයන්ගේ වර්තමාන ප්‍රවනතාව කෙබඳුවේ ද? (ලකුණු 02)

(ඉ) ශ්‍රී ලංකාවේ ආයෝජන ක්ෂේත්‍රයේ ඇති ප්‍රබල බාධක කවරේ ද? (ලකුණු 03)

(iii) "පසුගිය දසක දෙක තුළ ශ්‍රී ලංකාවේ සමස්ත දරිද්‍රතාවය අඩු වුවද එහි ආංශික විෂමතා තවදුරටත් පවතී".

(අ) ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 02)

(ආ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීමට ක්‍රියාත්මක කළ ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් කවරේ ද? (ලකුණු 02)

(ඉ) දරිද්‍රතාවය අඩු කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සමෘද්ධි වැඩසටහනේ දුර්වලතා කවරේ ද? (ලකුණු 02)

***